# 09. කස්සකො

## නවමො පාඨො



එකස්මිං ගාමෙ එකො කස්සකො වසති. සො සිරිදාසො නාම. තස්ස එකො පුත්තො භවති. සො සුනන්දො නාම. එකදා සිරිදාසො පුත්තෙන සද්ධිං තස්ස ඛෙත්තං ගච්ඡති. ඛෙත්තෙ කම්මං කත්වා සො පච්ඡා ගෙහං ආගච්ඡති. අථ ඛො සුනන්දො නාම පුත්තො තස්ස මාතුයා සහ ආපණං ගච්ඡති. තදා තස්ස මිත්තා මග්ගෙ කීළන්ති. සිරිදාසස්ස පුත්තස්ස ච එතදහොසි, ''අහං ච මම මිත්තෙන සද්ධිං කීළිතුං ගච්ඡාමී'ති'' අථ මාතරං වන්දිත්වා සො මිත්තෙහි සහ කීළිතුං ගච්ඡති.

### වචන මාලාව

1. එකස්මිං - එක්තරා
2. ගාම - ගම
3. කස්සක - ගොවියා
4. නාම - නම්
5. එකදා - එකදවසක්
6. සද්ධිං - සමග

| | |
|---|---|
| 7. ඛෙත්තං - කුඹුර | 12. කීළති - ක්‍රීඩා කරයි |
| 8. කත්වා - කොට | 13. එතදහොසි - මෙසේ සිත් විය |
| 9. පච්ඡා - පසුව | 14. මාතරං - මවට |
| 10. ආගච්ඡති - පැමිණෙයි. | 15. වන්දිත්වා - වැඳ |
| 11. ආපණ - කඩය | 11. දහරො - ළදරුවා |

## තතියා විභක්තිය

**කස්සකො <u>පුත්තෙන සද්ධිං</u> ඛෙත්තං ගච්ඡති**

(ගොවියා පුතා සමග කුඹුරට යයි.)

- තතියා විභක්තියෙන් **"විසින්", ''සමඟ''** යන අර්ථ යෙදේ.
- "සමඟ" යන අදහස වචනයකට දීමට අපි 'සද්ධිං, සහ' යන නිපාත පද ද භාවිත කරමු.
- එය යෙදිය යුත්තේ **තතියා විභක්ත්‍යන්ත** පදයක් සමග ය.
- එනිසා ''**පුත්ත**'' ශබ්දය ''**පුත්තෙන**'' යනුවෙන් තතියාවෙන් තබා ඇති බව ඉහත වාක්‍යයෙන් පෙනේ.

තතියා විභක්ති පද යොදා සැකසූ පහත වගන්ති බලන්න.

- සො මිත්තෙන සද්ධිං ගච්ඡති - ඔහු මිතුරා සමග යයි.
- අහං මාතුයා සද්ධිං ගච්ඡාමි - මම මව සමග යමි.
- මාතා දාරකෙන සහ සල්ලපති - මව දරුවා සමග කතා කරයි.
- ආචරියො සිස්සෙහි සහ ලිඛති - ගුරුවරයා ශිෂ්‍යයන් සමග ලියයි.
- සො සිරිදාසෙන සද්ධිං භුඤ්ජති - හෙතෙම සිරිදාස සමග අනුභව කරයි.

තතියා විභක්තියේ නාමපද වරනැගෙන අයුරු බලන්න.

| තතියා විභක්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධෙන | බුද්ධෙභි, බුද්ධෙහි |
| අග්ගි | අග්ගිනා | අග්ගීභි, අග්ගීහි |
| දණ්ඩී | දණ්ඩිනා | දණ්ඩීභි, දණ්ඩීහි |
| භික්ඛු | භික්ඛුනා | භික්ඛූභි, භික්ඛූහි |
| කඤ්ඤා | කඤ්ඤාය | කඤ්ඤාභි, කඤ්ඤාහි |
| නදී | නදියා, නජ්ජා | නදීභි, නදීහි |
| චිත්ත | චිත්තෙන | චිත්තෙභි, චිත්තෙහි |
| සබ්බ | සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |
| ඉම | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |

## අභ්‍යාසය 09 1

1. සිංහලට නගන්න.

    1. අහං සිසෙසන සද්ධිං වන්දාමි.
    2. මිත්තා ආනන්දෙන සහ ගච්ඡන්ති.
    3. ත්වං දාසෙන සහ ගච්ඡසි.
    4. දහරො මාතුයා සද්ධිං සයති.
    5. තෙ කස්සකෙන සද්ධිං ඛෙත්තං ගච්ඡන්ති.

2. පාලියට නගන්න.

    1. නුඹ සිරිදාස සමග යහි.
    2. මම සෝරත සමග ගෙදර යමි.
    3. ගොවියා මිතුරන් සමග කුඹුරට යයි.
    4. කවරෙක් ශිෂ්‍යයා සමග ලියයි ද?
    5. ඇමතිවරු රජු සමග කතා කරති.

3. ''සහ, සද්ධිං'' යන පද දෙක තතියා විභක්ති පද සමග යොදා වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

4. පාඩමේ එන කතාව සිංහලට නගන්න.

5. පිරිත් පොත බලා ''සහ'' සහ ''සද්ධිං'' යන නිපාත පද යෙදුණු පාලි වගන්ති සොයා ලියන්න.

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න.**

| ඊකාරාන්ත පුල්ලිඞ්ග ''දණ්ඩි'' ශබ්දය (දඬු ගත් තැනැත්තා) | | |
|---|---|---|
| **විභක්තිය** | **ඒකවචන** | **බහුවචන** |
| **පඨමා** | දණ්ඩි | දණ්ඩී, දණ්ඩිනො |
| **ආලපන** | (හෙ) දණ්ඩි | (හෙ) දණ්ඩී, දණ්ඩිනො |
| **දුතියා** | දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| **තතියා** | දණ්ඩිනා | දණ්ඩීභි, දණ්ඩීහි |
| **කරණ** | දණ්ඩිනා | දණ්ඩීභි, දණ්ඩීහි |
| **චතුත්ථී** | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| **පඤ්චමී** | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීභි, දණ්ඩීහි |
| **ඡට්ඨී** | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| **සත්තමී** | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩිසු, දණ්ඩීසු |